# මාසික

# විවරණිකාව

2011 මැයි



ශ්‍රී ලංකා මහ බැංකුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

61 වැනි වෙළුම 05 වැනි කලාපය

**2011 මැයි**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශය: ශ්‍රී ලංකා මහ බැංකුව , කොළඹ 01.**

| පටුන | | පිටුව |
|---|---|---|


1 වන කොටස - මාසික සිදුවීම් .... 05

2 වන කොටස - පුවත්පත් නිවේදන - 2011 මැයි .... 06

1. 2011 අප්‍රේල් මස උද්ධමනය .... 06
2. 2600 වැනි සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් නිකුත් කරනු ලබන සමරු කාසි .... 07 - 08
3. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2011 මැයි .... 09 - 10
4. 2009 දී උතුරු පළාතෙහි දළ දේශීය නිෂ්පාදිතය සියයට 14.2 කින් වර්ධනය විය .... 10 - 11
5. 2011 මාර්තු මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය .... 11 - 13
6. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2009,2010 සහ 2011 .... 14

**1 වන කොටස**

# මාසික සිදුවීම්

**2011 මැයි**

**රාජ්‍ය මූල්‍ය අංශය**

- අර්තාපල් සඳහා වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයකට රුපියල් 20 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 30 දක්වා වැඩිකරන ලදී.

**2 වන කොටස**

# පුවත්පත් නිවේදන

**2011 මැයි**

## 1. 2011 අප්‍රේල් මස උද්ධමනය

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2002 =100) මගින් මනිනු ලබන උද්ධමනය, 2011 මාර්තු මාසයේ පැවති 233.2 හි සිට අප්‍රේල් මාසයේ දී 233.4 දක්වා සියයට 0.1 කින් සුළු වශයෙන් ඉහළ නැගිණි. දර්ශකය 2011 පෙබරවාරි මාසයේ පැවති මට්ටමට (233.9) වඩා පහළ මට්ටමක පවතින බව සඳහන් කළ යුතුය.*




කෙසේ වුවද, ප්‍රධාන වශයෙන්ම පදනම් බලපෑම හේතුකොටගෙන ලක්ෂ්‍යමය උද්ධමනය 2011 මාර්තු මාසයේ පැවැති සියයට 8.6 සිට අප්‍රේල් මාසයේ දී සියයට 9.8 දක්වා ඉහළ නැගිණි. වාර්ෂික සාමාන්‍ය පදනම මත උද්ධමනය ද පූර්ව මාසයේ පැවැති සියයට 6.2 හි සිට අප්‍රේල් මාසයේ දී සියයට 6.6 දක්වා ඉහළ ගියේය. මේ අතර, ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය 2011 මාර්තු මස පැවති සියයට 3.6 හි සිට අප්‍රේල් මාසයේ දී සියයට 4.7 දක්වා ඉහළ නැගුණු අතර, වාර්ෂික සාමාන්‍ය අනුපාතිකය පූර්ව මාසයේ පැවැති සියයට 5.3 සිට අප්‍රේල් මාසයේ දී සියයට 5.1 දක්වා අඛණ්ඩව පහළ වැටිණි.

දර්ශකයෙහි සියයට 0.1 ක මාසික ඉහළ යෑම කෙරෙහි ප්‍රධාන වශයෙන්ම මාසය තුළ ඉන්ධන සහ ගෑස් මිල ගණන් සංශෝධනය කිරීම හේතුවෙන් ආහාර නොවන අයිතමයන්ගේ මිල ගණන් ඉහළ යෑම දායක විය. ආහාර උප කාණ්ඩයෙහි මිල ගණන් සියයට 1.7 කින් පහළ වැටිණි. එම උප කාණ්ඩය තුළ සහල්, එළවළු, අමුමිරිස්, බොහෝ මත්ස්‍ය වර්ග, ලොකු ළූණු, රතු ළූණු, බිත්තර, පොල් සහ පොල් තෙල් වැනි වැනි ප්‍රධාන ආහාර අයිතමයන් සියල්ලකම පාහේ මිල ගණන්, සැපයුමෙහි සිදු වූ වර්ධනයන් හේතුවෙන් පහළ වැටිණි. කෙසේ වුවද, උත්සව සමයේ ඉල්ලුම හේතුවෙන් කුකුළු මස් මිල ඉහළ ගිය අතර, පළතුරු සහ අර්තාපල් මිල ගණන්වල ද ඉහළ යෑමක් වාර්තා විය. ගෑස් සහ භූමිතෙල් මිල ගණන් ඉහළ නැංවීම හේතුවෙන් නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන උප කාණ්ඩයේ මිල ගණන් සියයට 3.1 කින් ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන්ම පෙට්‍රල් සහ ඩීසල් මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උප කාණ්ඩය සියයට 2.8 කින් ඉහළ නැගිණි. මේ අතර, රෙදිපිළි හා පාවහන් (සියයට 0.9); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 2.0); විනෝදාත්මක හා සංස්කෘතික (සියයට 0.3); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 1.2) යන උප කාණ්ඩයන්හි මිල ඉහළ යෑම් වාර්තා විය.

## 2. 2600 වැනි සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් නිකුත් කරනු ලබන සමරු කාසි

*සමස්ත ලෝකවාසී බෞද්ධයාගේ අසහාය ශාස්තෘන් වහන්සේ ශාක්‍යමුණි ගෞතම බුදුරජාණන් වහන්සේ වසර 2600 කට පෙර සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක. මෙම ආගමික සිද්ධියේ 2600 වැනි සංවත්සරය 2011 මැයි මස පුරපසළොස්වක දිනට යෙදී ඇත.*

මෙම අවස්ථාව සමරනු වස් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් 1000 සහ රුපියල් 10 වටිනාකමින් යුත් සමරු කාසි දෙකක් නිකුත් කරනු ලබයි. රුපියල් 1000 කාසිය හිමාකාරයෙන් ටංකිත රිදී සමරු කාසියක් වන අතර, රුපියල් 10 කාසිය සම්මත ප්‍රමාණයේ සංසරණ කාසියකි.

මුදල් නීති පනතේ 1998 අංක 6 දරණ සංශෝධනය පරිදි 52 (අ) වගන්තියේ (1) (අ) සහ (ආ) අනුව ගරු මුදල් ඇමතිතුමාගේ අනුමැතිය සහිතව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සමරු කාසි සහ නෝට්ටු නිකුත් කරනු ලබයි. වැදගත් අවස්ථාවන් සහ පුද්ගලයන් සැමරීම පිණිස 1957 වර්ෂයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සමරු කාසි නිකුත් කරනු ලබන අතර, මෙම සම්බුද්ධත්ව ජයන්ති කාසි එලෙස නිකුත් කරන ලද 52 වැනි සහ 53 වැනි සමරු කාසි වන්නේය.

### 1. හිමාකාරයෙන් ටංකිත රුපියල් 1000 රිදී කාසිය







කාසියේ මුහුණත මැද බුදුරජාණන් වහන්සේ සංකේතවත් කරමින් ශ්‍රී මහා බෝධිය දැක්වේ. "සම්බුද්ධ ජයන්තිය"යන්න සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් කාසියේ පරිධිය දිගේ දැක්වේ. කාසියේ පහළ 2011 වර්ෂය දැක්වේ.

කාසියේ පිටුපස මැද "සූවිසි විවරණ" සංකේතවත් කරමින් ගරාදි 24 කින් යුක්ත ධර්ම චක්‍රයක් දැක්වේ. "ශ්‍රී ලංකා" යන්න සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් කාසියේ පරිධිය දිගේ දැක්වේ. මුහුණත වටිනාකම "1000"යන්න විශාල ඉලක්කම්වලින් සහ "රුපියල්" යන්න සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ධර්ම චක්‍රයට පහළින් දැක්වේ.

### 2. සාමාන්‍ය සංසරණය සඳහා වන රුපියල් 10 කාසිය







කාසියේ මුහුණත මැද "සූවිසි විවරණ" සංකේතවත් කෙරෙන ගරාදි 24 කින් යුක්ත ධර්ම චක්‍රයක් දැක්වෙන අතර එහි මැද 2600 වර්ෂය දැක්වේ. "සම්බුද්ධත්ව ජයන්ති" යන්න සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සහ "යුෂ්මජත බුද්ධ සාසනේ" යන්න සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් කාසියේ පරිධිය දිගේ දැක්වේ.

කාසියේ පිටුපස මුහුණත වටිනාකම රුපියල් "10" යන්න විශාල ඉලක්කම්වලින් සහ "රුපියල් දහය" යන්න සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ඉලක්කම්වලට පහළින් දැක්වෙන අතර,එයට දෙපසින් වී කරල් දැක්වේ. 2011 වර්ෂය පහළින් මැද දැක්වේ. "ශ්‍රී ලංකා" යන්න සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් කාසියේ පරිධිය දිගේ දැක්වේ.

රුපියල් 1000 රිදී කාසිය රවම් හැඩයෙන් යුක්ත වන අතර විෂ්කම්භය මි.මී.38.61ක් ද, බර ග්‍රෑම් 28.28 ක් ද වේ. මෙම කාසි ආකර්ශණීය ඇසුරුමක බහා එක්සත් රාජධානියේ රෝයල් මින්ට් සමාගමේ සත්‍යතා සහතිකයක් ද සමග නිකුත් කරනු ලැබේ. රුපියල් 10 කාසිය සාමාන්‍ය සංසරණය සඳහා නිකුත් කරන ලද කාසියක් වන අතර, දැනට සංසරණයේ පවතින රුපියල් 10 කාසියට සමාන වේ.

මෙම රුපියල් 1000 කාසිය ශ්‍රී ලංකා මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා විසින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වෙත නිල වශයෙන් 2011.05.13 දින පිළිගැන්වීම කොළඹ දී සිදුකරනු ලැබේ. රුපියල් 1000 කාසිය, කාසි 2000 කින් යුතු සීමිත නිකුතුවක් වන අතර, කාසියක් රුපියල් 7500 ක මිලකට කොළඹ 1, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ කවුන්ටර්වලින් ද, රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක 58 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුදල් කෞතුකාගාරයෙන් ද අනුරාධපුර, මාතර, මාතලේ, යාපනය සහ ත්‍රිකුණාමලයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු පළාත් කාර්යාලවලින් සහ www.cbsl.gov.lk යන ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය හරහා ද 2011 මැයි මස 16 දින සිට අලෙවි කෙරේ.

මෙම රුපියල් 10 කාසිය 2011 ජූනි මස සිට සංසරණය සඳහා නිකුත් කිරීමට නියමිතය.

වැඩි විස්තර සඳහා:

| | | දුරකථන අංකය | ෆැක්ස් අංකය |
|---|---|---|---|
| ව්‍යවහාර මුදල් අධිකාරී | - | 011-2477355 | 2477726 |
| අතිරේක ව්‍යවහාර මුදල් අධිකාරී | - | 011-2477603 | |
| නියෝජ්‍ය ව්‍යවහාර මුදල් අධිකාරී | - | 011-2477014 | |
| විද්‍යුත් තැපෑල | - | currency@cbsl.lk | |
| මුදල් කෞතුකාගාරය, රාජගිරිය | - | 011 2477809 | |
| **පළාත් කාර්යාල** | | | |
| අනුරාධපුරය | - | 025 2222048 | 025 2225689 |
| මාතර | - | 041 2222268 | 041 2222719 |
| මාතලේ | - | 066 2223367 | 066 2222175 |
| යාපනය | - | 021 2221855 | 021 2221857 |
| ත්‍රිකුණාමලය | - | 026 2242333 | 026 2242332 |

අධිකාරී
ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො.30, ජනාධිපති මාවත
කොළඹ 01.

## 3. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2011 මැයි

*වෙළෙඳාම සම්බන්ධ ක්‍රියාකාරකම් සහ සංචාරක අංශය මගින් මෙහෙයවනු ලැබූ කර්මාන්ත සහ සේවා අංශයන්හි වර්ධන ප්‍රවණතා අඛණ්ඩවම පැවතීම මෙන්ම ඵලදායීතාව තවදුරටත් වර්ධනය වීම හේතුවෙන්, 2011 පළමු කාර්තුව තුළ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධනය පුළුල් ලෙස ඉලක්කගත මට්ටමේ පැවති නමුත් කෘෂිකාර්මික අංශයෙහි යම් පසුබෑසීමක් දක්නට ලැබුණි.*

දේශීය සැපයුම් තත්ත්වයන්, 2011 වසර මුල දී වූ ගංවතුර නිසා ඇති වූ බලපෑමෙන් යළි යථාතත්ත්වයට පත් වී ඇති අතර, පවතින කාලගුණික තත්ත්වයන් කෘෂිකාර්මික කටයුතු සහ ජලවිදුලිබල උත්පාදනය සඳහා හිතකර වේ. ජාත්‍යන්තර මිල ගණන්වල දක්නට ලැබූ ඉහළයාමේ ප්‍රවණතාව අඩු වූ නමුත් තවමත් බොහෝ පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් ඉහළ මට්ටමක පවතී. ජාත්‍යන්තර බොරතෙල් මිල ගණන්හි ස්ථායීතාවයක් ඇති කරමින්, තෙල් නිෂ්පාදනය කරන බොහෝ ආර්ථිකයන්වල දක්නට ලැබුණු භූ-දේශපාලන නොසන්සුන්තාවන් අඩු වී ඇති බව පෙනීයයි.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (පදනම් වර්ෂ = 2002) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මත ගණනය කරනු ලැබූ උද්ධමනය, 2011 මාර්තු මාසයේ දී වූ සියයට 8.6 සමග සැසඳීමේ දී අප්‍රේල් මාසයේ දී සියයට 9.8 ක් දක්වා ඉහළ ගිය අතර, මාර්තු මාසයේ දී සියයට 6.2 ක් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ද, අප්‍රේල් මාසයේ දී සියයට 6.6 ක් දක්වා වර්ධනය විය. කෙසේ වෙතත්, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ අප්‍රේල් මාසයේ වැඩිවීම සියයට 0.1 ක් වැනි ආන්තික අගයක් ගත් අතර, සැපයුම් තත්ත්වයන් වැඩිදියුණු වීම හේතුවෙන් මැයි මාසයේ සිට ඉදිරියට මිල ගණන් මත ඇති බලපෑම අඩුවනු ඇත.

ජාත්‍යන්තර පාරිභෝගික මිල ගණන්වල අපේක්ෂිත ඉහළයාමත් සමග 2011 දී, වෙළෙඳ හිඟය පුළුල් විය හැකි අතර, සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ඉහළ ඉපැයීම්, සේවක ප්‍රේෂණ හා ඉහළ ප්‍රාග්ධන ලැබීම්, සමස්ත ගෙවුම් ශේෂය මත ධනාත්මක බලපෑමක් ඇතිකරනු ඇතැයි අපේක්ෂා කෙරේ. තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, 2011 මාර්තු මස අවසානයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 6,993 ක් වූ දළ නිල සංචිත (ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් රහිතව) 2011 මැයි 12 වන දින වන විට එ.ජ.ඩොලර් මිලියන 7,120 ක් දක්වා වර්ධනය විය. 2011 වසරේ මේ දක්වා, දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළ තුළ රුපියල, එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 1.08 කින් ද, ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 1.22 කින් ද අධිප්‍රමාණය වූ අතර යූරෝවලට එරෙහිව සියයට 4.61 කින් ද ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 3.51 කින් ද ජපන් යෙන්වලට එරෙහිව සියයට 0.39 කින් ද අවප්‍රමාණය වී ඇත.

2011 වසරේ පළමු මාස තුන තුළ රාජ්‍ය ආදායම, 2010 වසරේ එම කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී සියයට 19.5 කින් වර්ධනය විය. 2011 අප්‍රේල් මස 24 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෝටර් රථවාහන ආනයනය සම්බන්ධයෙන් පැන වූ තීරු බදුවල සිදුකළ සංශෝධනය මගින් රජයේ ආදායම වර්ධනය විය හැක. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග අඛණ්ඩව ගනු ලබන අතර, රජය විසින් ප්‍රකාශයට පත්කරන ලද අයවැය හිඟය සඳහා වන ඉලක්ක ළඟාකරගත හැකි මට්ටමේ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$) වර්ධනය, 2011 මාර්තු මාසය තුළ දී ආන්තිකව අඩු වුවද, එය සාපේක්ෂ වශයෙන් සියයට 17.5 ක ඉහළ අගයක් වාර්තා කළ අතර, එයට මූලික වශයෙන් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණයෙහි සිදු වූ ශීඝ්‍ර වර්ධනය හේතුවිය. ඉහළ පාදක බලපෑම සමග මෝටර් රථ වාහන මිලදී ගැනීම් වැනි විශේෂිත අංශයන් සඳහා පසුගිය මාස කිහිපය තුළ දක්නට ලැබුණු ඉහළ ණය ඉල්ලුම අඩුවීමත් සමග ණය වර්ධන අනුපාතිකය 2011 වසරේ අප්‍රේල් මාසයේ සිට අඩු විය හැක. එමෙන්ම 2011 අප්‍රේල් 29 වන දින සිට ක්‍රියාත්මක කළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකයෙහි වෙනස්වීමට වෙළෙඳපොළ

ප්‍රතිචාර දක්වමින් සිටින අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රුපියල් බිලියන 18 ක් පමණ බැංකු පද්ධතියෙන් අවශෝෂණය කරගෙන ඇත.

ඉහත වර්ධනයන් සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය විසින් 2011 මැයි 16 වන දින පැවති රැස්වීමේ දී මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය දැනට පවතින මට්ටමේම පවත්වා ගැනීමට තීරණය කරන ලදී.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය 2011 ජූනි මස 10 වන දින නිකුත් කිරීමට නියමිතය.

## 4. 2009 දී උතුරු පළාතෙහි දළ දේශීය නිෂ්පාදිතය සියයට 14.2 කින් වර්ධනය විය

*2009 මැයි මාසයේ දී ගැටුම් නිමාවීමෙන් පසු උතුරු පළාතේ ආර්ථික කටයුතු ශීඝ්‍රයෙන් යථා තත්ත්වයට පත්වෙමින් පවතී. 2009 දී උතුරු පළාතෙහි ප්‍රාදේශීය නාමික දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධන වේගය සියයට 14.2 ක් ලෙස වාර්තා වූ අතර එය ශ්‍රී ලංකාවේ පළාත්වලින් වාර්තා වූ දෙවන ඉහළම වර්ධන වේගය විය. නැගෙනහිර පළාත සියයට 14.4 ක ඉහළම වර්ධනයක් වාර්තා කළේය. වසර පුරාවටම සාමය පැවතීම නිසා 2010 දී උතුරු පළාතෙහි ආර්ථික ක්‍රියාකාරකම් තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. උතුරු පළාත මගින් රටෙහි දළ දේශීය නිෂ්පාදිතයට වන දායකත්වය 2006 දී වූ සියයට 2.8 සිට 2009 දී සියයට 3.3 ක් දක්වා වර්ධනය විය.*

2009 මැයි මාසයේ දී ගැටුම් නිමාවීමෙන් පසු උතුරු පළාතේ ආර්ථික කටයුතු ශීඝ්‍රයෙන් යථා තත්ත්වයට පත්වෙමින් පවතී. 2009 දී උතුරු පළාතෙහි ප්‍රාදේශීය නාමික දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධන වේගය සියයට 14.2 ක් ලෙස වාර්තා වූ අතර එය ශ්‍රී ලංකාවේ *පළාත්වලින්* වාර්තා වූ දෙවන ඉහළම වර්ධන වේගය විය. නැගෙනහිර පළාත සියයට 14.4 ක ඉහළම වර්ධනයක් වාර්තා කළේය. වසර පුරාවටම සාමය පැවතීම නිසා 2010 දී උතුරු පළාතෙහි ආර්ථික ක්‍රියාකාරකම් තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. උතුරු පළාත මගින් රටෙහි දළ දේශීය නිෂ්පාදිතයට වන දායකත්වය 2006 දී වූ සියයට 2.8 සිට 2009 දී සියයට 3.3 ක් දක්වා වර්ධනය විය.

ගැටුම් නිමාවීමත් සමගම නැවත පදිංචි කිරීම්, ජීවනෝපාය සඳහා උපකාරී වීම මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා ආරම්භ කරන ලද උතුරු පළාත් සංවර්ධන වැඩසටහන "උතුරු වසන්තය" (වඩක්කිල් වසන්තම්) වැනි වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. සමස්ත වැඩසටහන සඳහා ඇස්තමේන්තු කරන ලද ආයෝජනය රුපියල් බිලියන 295 ක් වූ අතර, එයින් සියයට 60 ක පමණ ප්‍රමාණයක් එම පළාතේ ආදායම් ඉපයීමේ කටයුතු වැඩිදියුණු කිරීමට හා ජනතාවගේ ජීවන තත්ත්වය උසස්කිරීම අරමුණු කොටගෙන, ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වෙන්කරන ලදී.

පහතින් දක්වා ඇති දැනට පවතින තොරතුරුවලට අනුව, කෘෂිකාර්මික සහ සේවා අංශයන්ගෙන් වන ඉහළ දායකත්වය සමඟ උතුරු පළාතෙන් දළ දේශීය නිෂ්පාදිතයට ඉහළ දායකත්වයක් ලැබෙනු ඇතැයි පෙන්නුම් කෙරේ.

### කෘෂිකාර්මික අංශයේ වර්ධනය

2009/10 මහ කන්නයේ දී වූ හෙක්ටයාර 24,051 සිට 2010/11 මහ කන්නය වන විට, වී වගා කරන ලද බිම් ප්‍රමාණය (දළ වශයෙන්) සියයට 169 කින් හෙක්ටයාර 64,720 ක් දක්වා වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2009/10 මහ කන්නයට සාපේක්ෂව 2010/11 මහ කන්නයේ වී නිෂ්පාදිතය මෙට්‍රික් ටොන් 175,732 ක් දක්වා සියයට 81 කින් වර්ධනය විය. වී වගාකරන ලද බිම් ප්‍රමාණයේ ඉහළම වැඩිවීම කිලිනොච්චිය සහ වව්නියාව දිස්ත්‍රික්කවලින් වාර්තා විය.

උතුරු පළාතෙහි එළවළු ඇතුළුව අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගාකිරීම සඳහා යොදාගන්නා මුළු බිම් ප්‍රමාණය 2009/10 මහ කන්නයේ වූ හෙක්ටයාර 8,980 ක සිට 2010/11 මහ කන්නයේ දී සියයට 94 කින් හෙක්ටයාර 17,439 ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇතැයි

ඇස්තමේන්තු කොට ඇත. තවද අනෙකුත් ආහාර බෝග වන ලොකු ළූනු, බඩ ඉරිඟු, කව්පි, කඩල (කළු) සහ රටකජු වගාකිරීමේ බිම් ප්‍රමාණය වැඩි විය. ඊට අමතරව, 2010 දී මුහුදු මත්ස්‍ය නිෂ්පාදිතය සියයට 58 කින් මෙට්‍රික් ටොන් 33,600 දක්වා වර්ධනය විය. 2011 දී මත්ස්‍ය නිෂ්පාදිතයෙහි සැලකිය යුතු වර්ධනයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**සේවා අංශයේ වර්ධනය**

2009 මැයි මාසයේ සිට 2011 මැයි මාසය වන විට නව බැංකු ශාඛා 37 ක් සහ ව්‍යාප්ති කාර්යාල 22 ක් ස්ථාපනය කරමින් උතුරු පළාතෙහි බැංකු කටයුතු වඩාත් ශක්තිමත් කරන ලදී. ඒ සමගම, ගොවීන්ගේ නිෂ්පාදිත මිලට ගැනීම සඳහා සමුපකාර සහ සුපිරි වෙළෙඳසැල් ගොවීන් සමග වන සම්බන්ධතාවය තවදුරටත් වැඩිකරන ලදී.

උතුරු පළාතෙහි රැහැන් සහිත, රැහැන් රහිත, දේශීය රැහැන් රහිත ස්ථාවර දුරකථන සේවා මෙන්ම PayPhone ඇතුළුව දුරකථන සම්බන්ධතා ප්‍රමාණය 2008 දී වූ 46,919 සිට 2009 දී 74,729 ක් දක්වා සියයට 59 කින් වර්ධනය වූ අතර, උතුරු පළාතේ වාහන ප්‍රමාණය 2008 දී වූ 39,740 ක සිට 2009 දී 47,031 දක්වා සියයට 18 කින් වර්ධනය විය.

## 5. 2011 මාර්තු මාසයේ විදේශ වෙළෙඳමේ ක්‍රියාකාරිත්වය

*පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට, 2011 මාර්තු මාසයේ අපනයන ආදායම සහ ආනයන වියදම සැලකිය යුතු අන්දමින් වර්ධනය විය. සියළුම ප්‍රධාන අපනයන කාණ්ඩයන්හි වර්ධනයන් පිළිබිඹු කරමින් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී, 2011 මාර්තු මාසය සඳහා අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,057 දක්වා සියයට 59.5 කින් වර්ධනය විය. මාසික අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,000 මට්ටම ඉක්මවූ ප්‍රථම අවස්ථාව මෙය වේ.*

2011 මාර්තු මාසයේ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,689 දක්වා සියයට 73.0 කින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, වෙළෙඳ හිඟය එ.ජ.ඩොලර් මිලියන 632.4 ක් දක්වා පුළුල් විය. 2011 පළමු කාර්තුව තුළදී පිළිවෙළින්, සමුච්චිත අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 2,721 දක්වා සියයට 54.3 කින් ද, සමුච්චිත ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 4,458 දක්වා සියයට 39.9 කින් ද වර්ධනය විය.




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

2011 මාර්තු මාසයේ අපනයන වර්ධනයට විශාලතම දායකත්වය කාර්මික අපනයන මඟින් ලබාදුන් අතර, සැලකිය යුතු අන්දමින් වර්ධනය වූ රෙදිපිළි හා ඇඟළුම් අපනයන මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. යන්ත්‍ර සූත්‍ර හා උපකරණ හැරුණු විට කාර්මික අපනයනයන්හි අනෙකුත් සියළුම කාණ්ඩයන් 2011 මාර්තු මාසයේ දී යහපත් ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරන ලදී. නැව් සහ ගුවන් යානා ඉන්ධනවල ඉහළ පරිමාව සහ මිල ගණන් පිළිබිඹු කරමින් 2010 මාර්තු මාසය හා සැසඳීමේ දී ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන සියයට 361.1 කින් වර්ධනය විය. මෙම මාසය තුළ දී රබර් නිෂ්පාදිත අපනයනවලින් ලද ආදායම සියයට 75.6 කින් වර්ධනය විය. 2011 මාර්තු මාසයේ දී මුළු අපනයන ආදායමින් සියයට 16.0 ක දායකත්වයක් ලබාදුන් කෘෂිකාර්මික අපනයන පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 40.3 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර, ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ තේ, රබර්, පොල් සහ සුළු කෘෂිකාර්මික අංශයන්ගේ මිල ගණන් අඛණ්ඩව ඉහළයාම හේතුවෙන් මෙම අපනයනයන්ගේ යහපත් ක්‍රියාකාරිත්වයක් පෙන්වන ලදී. ජාත්‍යන්තර වෙළෙඳපොළේ පැවැති ඉහළ තෙල් මිල ගණන්වලට සමගාමීව 2011 මාර්තු මාසයේ දී රබර් කිලෝග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී එ.ජ.ඩොලර් 5.13 දක්වා සියයට 70.5 කින් වැඩි විය. 2011 මාර්තු මාසය තුළ දී තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල තවදුරටත් එ.ජ.ඩොලර් 4.86 ක් ලෙසින් ඉහළ අගයක පැවතිණි. 2011 මාර්තු මාසයේ දී සුළු කෘෂිකාර්මික බෝග අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 40.3 දක්වා සියයට 75 කින් වර්ධනය වූ අතර, කොකෝවා නිෂ්පාදිත, තල ඇට, සාදික්කා සහ වසාවාසි ආදියෙහි පැවති ඉහළ මිල ගණන් මේ සඳහා හේතු විය.

ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ඉහළ මිල ගණන් සහ ඉහළ දේශීය ඉල්ලුම පිළිබිඹු කරමින් 2011 මාර්තු මාසයේ දී සියළුම ප්‍රධාන ආනයන කාණ්ඩයන් වර්ධනය විය. ආනයනවල සමස්ත වර්ධනය සඳහා විශාලතම දායකත්වය පිළිවෙලින් අන්තර් භාණ්ඩ (සියයට 60.1) සහ පාරිභෝගික භාණ්ඩ (සියයට 21.3) වලින් විය. ඛනිජ තෙල් සහ රෙදිපිළි හා ඇඟළුම් ආනයනවල සැලකිය යුතු ඉහළයාම හේතුවෙන් අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යන ලදී. 2011 මාර්තු මාසයේ දී බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයනික මිල එ.ජ.ඩොලර් 111.31 ක් විය. ඇඟළුම් අපනයන සඳහා යෙදවුම් ලෙස යොදාගන්නා රෙදිපිළි හා ඇඟළුම් ආනයන මෙම මාසය තුළ දී සියයට 115.5 කින් ඉහළ යන ලදී. 2011 මාර්තු මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ ගිය අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මෝටර් රථ (එ.ජ.ඩොලර් මිලියන 90), බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත (එ.ජ.ඩොලර් මිලියන 28) සහ විදුලි උපකරණ (එ.ජ.ඩොලර් මිලියන 14) ආනයන හේතුවෙන් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළයාමය. සීනි (එ.ජ.ඩොලර් මිලියන 51) සහ තිරිඟු (එ.ජ.ඩොලර් මිලියන 52) ආනයන සඳහා වූ ඉහළ වියදම හේතුවෙන් ආහාර සහ පාන ආනයන වියදම ද ඉහළ යන ලදී. යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණවල ආනයන වියදම සැලකිය යුතු ලෙස වැඩිවීම හේතුවෙන් 2011 මාර්තු මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන ද ඉහළ යන ලදී.

2010 වසරේ අදාළ කාලපරිච්ඡේදය සමඟ සසඳන විට 2011 මාර්තු මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් මිලියන 503 දක්වා සියයට 34.9 කින් වර්ධනය විය. 2011 අප්‍රේල් මස අවසන් වන විට ආසියානු නිෂ්කාශන සංගමයේ (ACU) ලැබීම් රහිත දළ නිල සංචිත ප්‍රමාණය ඉලක්කගත මට්ටමට වඩා ඉහළින් එ.ජ.ඩොලර් බිලියන 7.2 ක් ලෙස අඛණ්ඩව පැවතුණි. පසුගිය මාස 12 තුළ පැවති සාමාන්‍ය මාසික ආනයන වියදම වන එ.ජ.ඩොලර් මිලියන 1,273 ට අනුව බලන විට, ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් රහිත දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 5.6 කට සමාන වේ.

## විදේශ වෙළෙඳාමෙහි ක්‍රියාකාරිත්වය - 2011 මාර්තු සහ 2011 ජනවාරි - මාර්තු

| කාණ්ඩය | 2010 මාර්තු එ.ජ.ඩො. මිලියන | 2011 මාර්තු එ.ජ.ඩො. මිලියන | මාර්තු වර්ධනය % | 2010 ජනː සිට මාර්තු එ.ජ.ඩො. මිලියන | 2011 ජනː සිට මාර්තු එ.ජ.ඩො. මිලියන | ජනː සිට මාර්තු වර්ධනය % |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **662.7** | **1,057.0** | **59.5** | **1,763.3** | **2,720.9** | **54.3** |
| කෘෂිකාර්මික | 156.6 | 219.6 | 40.3 | 469.0 | 592.9 | 26.4 |
| මෙයින්: තේ | 105.5 | 134.6 | 27.5 | 305.6 | 369.9 | 21.0 |
| කාර්මික | 495.9 | 813.5 | 64.0 | 1,268.6 | 2,077.7 | 63.8 |
| මෙයින්: රෙදිපිළි හා ඇඟළුම් | 281.0 | 473.0 | 68.3 | 703.2 | 1,225.0 | 74.2 |
| රබර් නිෂ්පාදිත | 45.0 | 79.1 | 75.6 | 110.6 | 204.0 | 84.5 |
| ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 44.8 | 58.4 | 30.6 | 129.9 | 156.3 | 20.3 |
| ඛනිජ ද්‍රව්‍ය | 10.2 | 12.0 | 17.6 | 25.7 | 33.0 | 28.3 |
| **ආනයන** | **976.5** | **1,689.4** | **73.0** | **3,187.6** | **4,458.0** | **39.9** |
| පාරිභෝගික භාණ්ඩ | 251.2 | 402.9 | 60.4 | 740.2 | 1,002.8 | 35.5 |
| මෙයින්: ආහාර හා පාන වර්ග | 174.9 | 222.4 | 27.2 | 521.5 | 557.0 | 6.8 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 76.3 | 180.5 | 136.6 | 218.7 | 445.8 | 103.9 |
| අන්තර් භාණ්ඩ | 503.2 | 931.9 | 85.2 | 1,648.3 | 2,430.1 | 47.4 |
| මෙයින්: ඛනිජ තෙල් | 171.3 | 298.0 | 74.0 | 714.7 | 923.7 | 29.3 |
| රෙදිපිළි හා ඇඟළුම් | 117.6 | 253.5 | 115.5 | 367.2 | 596.5 | 62.5 |
| ආයෝජන භාණ්ඩ | 210.8 | 348.7 | 65.4 | 691.5 | 1,008.3 | 45.8 |
| මෙයින්: යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 83.9 | 163.7 | 95.2 | 285.4 | 445.6 | 56.1 |
| ප්‍රවාහන උපකරණ | 43.9 | 74.6 | 69.8 | 136.0 | 243.7 | 79.1 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 61.5 | 78.4 | 27.5 | 195.8 | 220.3 | 12.5 |
| **වෙළෙඳ ශේෂය** | **-313.8** | **-632.4** | **101.5** | **-1,424.3** | **-1,737.2** | **22.0** |
| **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** | **373.2** | **503.4** | **34.9** | **996.5** | **1,273.7** | **27.8** |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

## 6. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද)
## 2009, 2010 සහ 2011

(2002= 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2009** | **2010** | **2011** | **2009** | **2010** | **2011** | **2009** | **2010** | **2011** | **2009** | **2010** | **2011** |
| ජනවාරි | 203.1 | 216.4 | 231.2 | -0.3 | 1.4 | 1.3 | 10.7 | 6.5 | 6.8 | 21.6 | 3.1 | 6.0 |
| පෙබරවාරි | 202.9 | 216.9 | 233.9 | -0.1 | 0.2 | 1.2 | 7.6 | 6.9 | 7.8 | 20.3 | 3.1 | 6.1 |
| මාර්තු | 202.0 | 214.8 | 233.2 | -0.4 | -1.0 | -0.3 | 5.3 | 6.3 | 8.6 | 18.6 | 3.2 | 6.2 |
| අප්‍රේල් | 201.0 | 212.6 | 233.4 | -0.5 | -1.0 | 0.1 | 2.9 | 5.8 | 9.8 | 16.7 | 3.4 | 6.6 |
| මැයි | 205.1 | 215.9 | 233.8 | 2.0 | 1.6 | 0.6 | 3.3 | 5.3 | 8.8 | 14.7 | 3.6 | 6.9 |
| ජුනි | 207.8 | 217.7 | | 1.3 | 0.8 | | 0.9 | 4.8 | | 12.5 | 3.9 | |
| ජූලි | 208.7 | 217.6 | | 0.4 | 0.0 | | 1.1 | 4.3 | | 10.4 | 4.2 | |
| අගෝස්තු | 208.1 | 218.6 | | -0.3 | 0.5 | | 0.9 | 5.0 | | 8.5 | 4.5 | |
| සැප්තැම්බර් | 208.6 | 220.7 | | 0.2 | 1.0 | | 0.7 | 5.8 | | 6.6 | 5.0 | |
| ඔක්තෝබර් | 209.4 | 223.3 | | 0.4 | 1.2 | | 1.4 | 6.6 | | 5.2 | 5.4 | |
| නොවැම්බර් | 211.0 | 225.8 | | 0.8 | 1.1 | | 2.8 | 7.0 | | 4.1 | 5.8 | |
| දෙසැම්බර් | 213.5 | 228.3 | | 1.2 | 1.1 | | 4.8 | 6.9 | | 3.4 | 5.9 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව